# 17

# අල්කුර්ආන් හැඳින්වීම

අල්ලාහ්තාආලා විසින් මිනිසාට දායාද කළ පොදු මග පෙන්වීම අල්කුර්ආනයයි. එබැවින් එය ජීවන මාර්ගයක් ලෙස පිළිගෙන ඒ අනුව කටයුතු කිරීම වගකිමක් වේ. අල්ලාහ් හා අප අතර සබඳතාව වර්ධනය වන්නේ එවිට ය. එය පාරායනයට හා අධ්‍යයීනයට ඇල්මක් ඇති වේ. එහි උපදේශනයන් ක්‍රියාවට නැංවීම සඳහා සිත  ඉඩ දෙයි.

නබි (සල්) තුමාට වයස 40 දී ඉක්රඃ යන වාක්‍යයෙන් ආරම්භ වන සූරතුල් අලක් (96) හි පළමු වදන් පහ ප්‍රදානය විය. එතැන් පටන් නබිතුමාගේ වෆාතය දක්වා වසර 23 ක් තිස්සේ කොටස් වශයෙන් ප්‍රදානය කොට නිමා විය. නබි (සල්) තුමාණන්ට ප්‍රදානය කළ අල්කුර්ආනය ලෝකයාට පහළ කළ අවසාන දහම වන්නේ ය. එයට ''අල්ෆූර්කාන්'', ''අල්කිතාබ්'', ''අත්තන්සීල්'' යනාදී විවිධ නාමයන් ඇත.

නබි සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම් තුමාගේ කාලයේ අල්කුර්ආනය ග්‍රන්ථාරූට රූඪ නොවී ය. පොදුවේ සියලුම සහාබාවරුන් අවශ්‍ය ප්‍රමාණයට වනපොත්



කොට තිබිණි. පාරායනය කළේ ද වනපොත් කළ අල් කුර්ආනයයි. නබි සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම් තුමාණන් විසින් පත් කළ සමහර සහාබාවරු අල්කුර්ආනයේ වාක්‍ය විවිධ ලේඛනවල සටහන් කොට සුරක්ෂිතව තබූ හ. ඔවුන් කුත්තාබුල් වහී (වහී ලියන්නන්) නමින් අමතන ලදී. එම ලේඛන එක්රැස්කර පළමුව අබූබක්කර් සිද්දීක් රලියල්ලාහු අන්හු තුමාගේ යුගයේත් ඉන්පසු උස්මාන් රලියල්ලාහු අන්හු තුමාගේ පාලන කාලයේ දීත් ''මුස්හෆ්'' සකස් කරන ලදි. එම පිටපත් පදනම් කොට ගෙන වත්මන් අල්කුර්ආන් පොත් මුද්‍රණය කරනු ලබයි.

අල්කුර්ආනයේ වදන් 6666 ක් ඇත. ඒවා පරිච්ඡේද 114 ක අන්තර්ගත වී තිබේ. වදන් ''ආයත්'' යනුවෙන් ද පාඩම් ''සූරා'' යනුවෙන් ද අමතනු ලැබේ. අල්කුර්ආනයේ වදන් ජුස්උ තිහක් වශයෙන් වෙන් කොට ඇත. දින හතකින් පාරායනය කළ හැකිවන සේ මන්සිල් 7 කට බෙදා ඇත.

අල්කුර්ආනය ග්‍රන්ථයක් වශයෙන් දක්නට ලැබුණ ද එය අල්ලාහ්ගේ කතාව (කලාමුල්ලාහ්) වේ. එබැවින් සෑම මුස්ලිම්වරයෙකු ම එය තම ප්‍රාණයට වඩා අගය කළ යුතු ය. දිනපතා එය පාරායනය කළ යුතු ය. මන්ද යත් අල්කුර්ආනය පාරායනය කිරීම (කිරාඅතුල් කුර්ආන්) අධික ආනිශංස ලබා දෙන ඉබාදතයකි.

අල්කුර්ආනය පාරායනය කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිපැදිය යුතු ය.

- වුළූ කර පිරිසිදුව සිටීම.
- ශරීරය, ඇඳුම් යනාදිය පිරිසිදුව තබාගැනීම.
- අල්කුර්ආනය පාරායනය කිරීම අරම්භ කරන විට ''අඌදු'' පවසා ෂයිතාන්ගෙන් ආරක්ෂාව පැතීම.
- ඉන් අනතුරු ව ''බිස්මිල්ලාහ්'' පැවසීම.
- තජ්වීද් ක්‍රමය පිළිපැද අලංකාර ව පාරායනය කිරීමට උත්සාහ කිරීම.
- සජ්දාවේ වදන් පාරායනය කිරීමේදී සජ්දා තිලාවත් කිරීම.
- අන් අයට බාධාවන අයුරින් පාරායනය කිරීමෙන් වැලකීම.
- අල්කුර්ආනය පාරායනය කිරීමේ දී නිහඬව සිට සවන් දීම.

- වැසිකිළි කැසිකිළි වැනි තහනම් කළ ස්ථානයන්හි අල්කුර්ආනය පාරායනයෙන් වැළකීම.
- නජීස් වූ ස්ථානයන්ට එය රැගෙන යාමෙන් වැළකීම.

පරලොව දී අප වෙනුවෙන් ''ෂෆාඅත්'' කරනු ලබන අල්කුර්ආනය දිනපතා පාරායනය කරමු. ඒ අනුව ජීවත් වී දෙලොවෙහිම ජය ලබමු.

**අභ්‍යාස**

1. පහත සඳහන් අරාබි පදවල අර්ථය ලියන්න.
   1 කිරාඅතුල් කුර්ආන්
   2 සජ්දා
   3 කලාමුල්ලාහ්
   4 කුත්තාබුල් වහී
2. අල්කුර්ආනය ''ජුස්උ'' කීයකට බෙදා තිබේ ද?
3. කුර්ආන් පාරායනය කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු 5 ක් ලියන්න.